

# ආර්ථික විද්‍යාව

# 12 ශ්‍රේණිය

# නිපුණතාව 2.1 – 2.8

## ඉල්ලුම, සැපයුම හා නම්‍යතාව





**2.8 :- සැපයුම් ප්‍රමාණය වෙනස් වීම හා සැපයුම වෙනස් වීම අතර වෙනස සසඳයි.**

**විෂය අන්තර්ගතය :-**

- සැපයුම් ප්‍රමාණය වෙනස් වීම
  - සැපයුම් ප්‍රමාණය වැඩි වීම
  - සැපයුම් ප්‍රමාණය අඩු වීම
- සැපයුම වෙනස් වීම
  - සැපයුම වැඩි වීම හා ඊට හේතු
  - සැපයුම අඩු වීම හා ඊට හේතු

**<u>සැපයුම් ප්‍රමාණය වෙනස් වීම සහ සැපයුම වෙනස්වීම යන සංකල්ප අතර වෙනස</u>**

<table>
<tr><th>සැපයුම් ප්‍රමාණය වෙනස්වීම</th><th>සැපයුම වෙනස්වීම</th></tr>
<tr><td>
සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල අඩු හෝ වැඩි වීමට ප්‍රතිචාරිව සැපයුම් ප්‍රමාණය අඩු හෝ වැඩි වීම නිසා සැපයුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය සැපයුම් වක්‍රය දිගේ ඉහළට හෝ පහළට ගමන් කිරීම සැපයුම් ප්‍රමාණය වෙනස් වීම ලෙස හඳුන්වයි.




අදාල භාණ්ඩයේ මිල රු. 20 සිට 30 දක්වා වැඩි වන විට A ලක්ෂ සිට C ලක්ෂය දක්වා සැපයුම් වක්‍රය දිගේ ඉහලට ගමන් කරයි.

එසේම මිල රු. 20 සිට 16 දක්වා අඩු වන විට A ලක්ෂයේ සිට B ලක්ෂයට සැපයුම් වක්‍රය දිගේ පහලට ගමන් කරයි.
</td><td>
සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබිය දී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස්වීම නිසා පැවති මිල යටතේ ම සැපයුම වැඩි හෝ අඩු වීම කරණ කොටගෙන සැපයුම් වක්‍රය වමට හෝ දකුණට විතැන් වීම සැපයුම වෙනස්වීම ලෙස හඳුන්වයි.




මිල ස්ථාවරව පවතිද්දී අනෙකුත් සාධකයන් වෙනස් වන විට සැපයුම වැඩි වී සැපයුම් වක්‍රය දකුණට විතැන් වීම හෝ සැපයුම අඩු වී සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
</td></tr>
</table>

**<u>සැපයුම වෙනස් වීමට බලපාන සාධක</u>**

1. සම්බන්ධිත භාණ්ඩවල මිල වෙනස් වීම
2. යෙදවුම් වල මිල වෙනස් වීම
3. තාක්ෂණය වෙනස් වීම
4. රජයේ ප්‍රතිපත්ති
5. අනාගත මිල වෙනස් වෙතැයි අපේක්ෂාව
6. සැපයුම්කරුවන් සංඛ්‍යාව වෙනස් වීම

## සලකා බලන භාණ්ඩයේ මිල වෙනස්වන විට එහි සැපයුම් ප්‍රමාණය වෙනස්වන ආකාරය

සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිලත් එහි සැපයුම් ප්‍රමාණයත් අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතී. එනම් අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වන විට එම භාණ්ඩයෙන් ලැබෙන ලාභාන්තිකය වැඩි වේ. එවිට නව සැපයුම් කරුවන් පිරිසක් වෙළෙඳපොළට පිවිසෙයි. එම නිසා සැපයුම් ප්‍රමාණය වැඩි වේ. සලකා බලන භාණ්ඩයේ මිල අඩු වන විට එම භාණ්ඩයෙන් ලැබෙන ලාභාන්තිකය අඩු වේ. එවිට සැපයුම්කරුවන් පිරිසක් වෙළෙඳපොළෙන් ඉවත් වේ. සැපයුම් ප්‍රමාණය අඩු වේ.




## 1.සම්බන්ධිත භාණ්ඩවල මිල වෙනස් වන විට සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස් වන ආකාරය

සලකා බලන භාණ්ඩය නිපදවීමට යොදා ගනු ලබන යෙදවුම් හා තාක්ෂණය භාවිතා කොට නිපදවිය හැකි වෙනත් භාණ්ඩ සම්බන්ධිත භාණ්ඩ ලෙස හඳුන්වයි.

උදා :- සලකා බලන භාණ්ඩය පාන් නම් පාන් පිටි ආදී යෙදවුම් භාවිතා කොට නිපදවිය හැකි බනිස්, රෝස් පාන් ආදී දෑ සම්බන්ධිත භාණ්ඩ ලෙස හැඳින්විය හැක.

සම්බන්ධිත භාණ්ඩවල මිල හා සලකා බලන භාණ්ඩයේ සැපයුම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතී. එනම් සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සම්බන්ධිත භාණ්ඩයේ මිල වැඩි වුවහොත් එය නිපදවීම ලාභදායී බැවින් සලකා බලන භාණ්ඩය නිපදවීමට යොදාගත් යෙදවුම් සම්බන්ධිත භාණ්ඩය නිපදවීමට මාරු කරයි. එවිට සලකා බලන භාණ්ඩයේ පවතින මිල යටතේ සැපයුම අඩු වේ. සැපයුම් වක්‍රය වමට විතැන් වේ. සම්බන්ධිත භාණ්ඩයේ මිල අඩු වුවහොත් එය නිපදවිම අලාභදායී බැවින් සම්බන්ධිත භාණ්ඩයේ මිල අඩු වුවහොත් එය නිපදවීම අලාභදායී බැවින් සම්බන්ධිත භාණ්ඩය නිපදවීමට යොදාගත් යෙදවූම් සලකා බලන

භාණ්ඩය නිපදවීමට මාරු කරයි. එවිට සලකා බලන භාණ්ඩය සඳහා පවත්නා මිල යටතේ සැපයුම වැඩි වේ. සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




## 2.යෙදවුම් වල මිල වෙනස් වන විට සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස් වන ආකාරය

සලකා බලන භාණ්ඩය නිපදවීමට යොදා ගන්නා යෙදවුම් වන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය ආදී සාධකවලට ගෙවිය යුතු බදුකුලිය, වැටුප්, පොලිය හා ලාභ ආදී මිල ගණන් යෙදවුම්වල මිල ලෙස හඳුන්වයි. යෙදවුම් වල මිල හා සලකා බලන භාණ්ඩයේ සැපයුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් ඇත. එනම් සැපයුම තීරණය විමට බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී යෙදවුම්වල මිල වැඩි වන විට සලකා බලන භාණ්ඩය නිපදවීමට වැය වන පිරිවැය ඉහළ යයි. එවිට ලාභාන්තිකය පහළ යයි. ලාභ පහළ යන විට සැපයුම්කරුවන් පිරිසක් වෙළෙඳපොළෙන් ඉවත් වෙයි. සලකා බලන භාණ්ඩයට පවතින මිල යටතේ සැපයුම අඩු වේ. සැපයුම් වක්‍රය වමට විතැන් වේ.

අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දි යෙදවුම්වල මිල පහළ යන විට සලකා බලන භාණ්ඩය නිපදවීමට වැය වන පිරිවැය පහළ යයි. එවිට ලාභාන්තිකය ඉහළ යයි. ලාභ ඉහළ යන විට නව සැපයුම් කරුවන් පිරිසක් වෙළෙඳපොළට එකතු වේ. සලකා බලන භාණ්ඩයට පවතින මිල යටතේ සැපයුම වැඩි වේ. සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




## 3.තාක්ෂණය වෙනස් වන විට සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස් වන ආකාරය

තාක්ෂණය යනු භාණ්ඩය හෝ සේවාව නිපදවීමට යොදා ගනු ලබන ශිල්පීය දැනුම වේ. තාක්ෂණය භාණ්ඩ හෝ සේවා නිපදවීමට වැය වන පිරිවැය තීරණය කරන සාධකයකි.

තාක්ෂණය දියුණු වන විට අදාළ භාණ්ඩය හෝ සේවාව නිපදවීම සඳහා වැය වන පිරිවැය පහළ යයි. අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දි නිෂ්පාදන පිරිවැය පහළ යන විට එම භාණ්ඩයෙන් ලැබෙන ලාභාන්තිකය ඉහළ යයි. ලාභ ඉහළ යන විට නව සැපයුම්කරුවන් වෙළඳපොළට ඇතුළු වේ. පවතින මිල යටතේ සැපයුම වැඩි වේ. සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.

තාක්ෂණය පිරිහෙන විට අදාළ භාණ්ඩය හෝ සේවාව නිපදවීමට වැය වන පිරිවැය ඉහළ යයි. අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී පිරිවැය ඉහළ යන විට එම භාණ්ඩයෙන් ලැබෙන ලාභාන්තිකය පහළ

යයි. ලාභය අඩු වන විට සැපයුම්කරුවන් පිරිසක් වෙළෙඳපොළෙන් ඉවත් වේ. එවිට පවත්නා මිල යටතේ සැපයුම අඩු වේ. සැපයුම් වක්‍රය වමට විතැන් වේ.




## 4.රජයේ ප්‍රතිපත්ති

සැපයුම වෙනස්වීමට බලපාන රාජ්‍ය ප්‍රතිපත්ති 2ක් ඇත.

1. නිෂ්පාදකයා මත බදු පැනවීම
2. නිෂ්පාදකයාට සහනාධාර දීම

### නිෂ්පාදකයා මත බදු පැනවීම

ඇතැම් නිෂ්පාදනයන් අධෛර්යමත් කිරීමේ අපේක්ෂාවෙන් රජය විසින් නිෂ්පාදකයා නිපදවන භාණ්ඩ ඒකක ප්‍රමාණය පදනම් කරගෙන බද්දක් අය කිරීම නිෂ්පාදකයා මත බදු පැනවීම ලෙස හදුන්වයි. නිෂ්පාදකයා මත බදු පනවන විට නිෂ්පාදකයාගේ ආදායම අඩු වේ. ආදායම අඩු වන විට නිෂ්පාදකයාගේ ලාභාන්තිකය අඩු වේ. ලාභය අඩු වන විට නිෂ්පාදකයින්ගෙන් පිරිසක් වෙළෙඳපොළෙන් ඉවත් වේ. පවත්නා මිල යටතේ සැපයුම අඩු වේ. සැපයුම් වක්‍රය වමට විතැන් වේ.




### නිෂ්පාදකයාට සහානාධාර දීම

නිෂ්පාදිතයන් දිරිගැන්වීම සඳහා රජය විසින් නිෂ්පාදකයින් හට නිපදවන භාණ්ඩ හා සේවා ඒකක ප්‍රමාණය පදනම් කරගෙන යම් මුදලක් හෝ ද්‍රව්‍ය නිෂ්පාදකයාට පිරිනැමීම සහනාධාර ලබාදීම ලෙස හඳුන්වයි.

සහනාධාරයක් ලබා දුන් විට නිෂ්පාදකයින්ගේ ආදායම ඉහළ යයි. ආදායම ඉහළ යන විට ලාභ වැඩි වේ. ලාභ වැඩි වන විට නව සැපයුම්කරුවන් වෙළෙඳපොළට ඇතුළත් වේ. පවතින මිල යටතේ සැපයුම වැඩි වේ සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.



## අනාගත මිල අපේක්ෂණ මත සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස් වන ආකාරය

සලකා බලන භාණ්ඩයේ මිල අනාගතයේදී අඩු වෙතැයි හෝ වැඩි වෙතැයි කියා සැපයුම්කරු තුළ වර්තමානයේ පවතින අපේක්ෂාව අනාගත මිල අපේක්ෂාව ලෙස හඳුන්වයි.

සලකා බලන භාණ්ඩයේ මිල අනාගතයේ දී වැඩි වෙතැයි අපේක්ෂාවක් ඇති වුවහොත් වර්තමානයේ පවත්නා මිල යටතේ සැපයුම අඩු කරයි. සැපයුම් වක්‍රය වමට විතැන් වේ. සලකා බලන භාණ්ඩයේ මිල අනාගතයේ දී අඩු වෙතැයි අපේක්ෂාවන් ඇති වුවහොත් වර්තමානයේ පවත්නා මිල යටතේ සැපයුම වැඩි කරයි. සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




## වෙළෙඳපොළේ සිටන සැපයුම්කරුවන් සංඛ්‍යාව වෙනස් වන විට සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස් වන ආකාරය

වෙළෙඳපොළේ සිටින සැපයුම්කරුවන් සංඛ්‍යාව කාලගුණය, උත්සව ආදී හේතු නිසා අඩු හෝ වැඩි විය හැකිය. වෙළෙඳපොළේ සිටින සැපයුම්කරුවන් සංඛ්‍යාව වැඩි වුවහොත් පවතින මිල යටතේ සැපයුම වැඩි වේ. සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.

වෙළෙඳපොළේ සිටින සැපයුම්කරුවන් සංඛ්‍යාව අඩු වුවහොත් පවතින මිල යටතේ සැපයුම අඩු වේ. සැපයුම් වක්‍රය වමට විතැන් වේ.

